## බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව - සංඝමිත්තා හා ජෙනිංග්ස්

නුගේගොඩ හා නාරාහේන්පිට බෝම්බ සිද්ධිවලින් පෙන්නුම් කෙරෙන්නේ කොටි තම අවසන් අදියරට පැමිණ ඇති බව ය. දෙමළ දේශපාලනඥයන් අතර කොටින්ගේ වැඩිම වෛරයට පාත්‍ර වී සිටින ඩග්ලස් දේවානන්ද මහතා අවසාන මොහොතේ දිවත් ඝාතනයකිරීම ඔවුන්ගේ වෑයම වෙයි. අනෙක් අතට ඔවුහු සාමාන්‍ය සිංහල ජනතාව වැඩි වශයෙන් ගැවසෙන තැන්වල බෝම්බ පිපරවීමට නැවතත් අවසාන මොහොතේ දී යොමු වී සිටිති. මෙහි දී කොටි මිලේච්ඡයන් පරාජය කිරීම හැර වෙනත් විකල්පයක් නැත. ඒ අරමුණින් ඉතා වැඩි මුදලක් වෙන්කර ඇති අයවැය පරාජයකිරීමට කොටින්ගේ පාර්ලිමේන්තු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානයටත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවලටත් ඒ රටවල නියෝජිතයා වූ එක්සත් ජාතික පක්ෂයටත් අවශ්‍ය වීම පුදුමයක් නො වේ. අයවැය ඡන්දයට පෙරදින එක් බටහිර රටක තානාපතිවරයකු එ ජා පක්ෂයේ ඉහළම නායකයකුගේ නිවසෙහි පාන්දර දෙක පමණ වන තුරු ගත කරමින් අයවැයට විරුද්ධව ඡන්දය දීමට මන්ත්‍රීන් මෙහෙයවූ බව සැළ ය. මේ සම්බන්ධයෙන් තවත් කිවයුතු වන්නේ එක් කරුණක් පමණකි. ජ වි පෙ තම තකතීරු තීරණය වෙනස්කර අයවැය තුන්වැනි කියවීමේ දී කොටි පරාජයකිරීම සඳහා ඡන්දය දිය යුතු ය. එසේ නොකළහොත් ඔවුන් කොටින්ට විරුද්ධව කරන ප්‍රකාශ දියවන්නාවෙන් හමන සුළඟේ පාවෙන හිස් ප්‍රකාශ පමණක් බවට පත්වනු ඇත.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව යන තේමාවෙන් ලියැවෙන මේ ලිපි පෙළ බයිලා කතුවරයාට පිළිතුරක් නො වේ. මෙහි ප්‍රතිචාර දැක්වෙන්නේ ඔහු විසින් සඳහන් කරනු ලැබ ඇති යම් යම් කරුණුවලට බව සැබෑ ය. එහෙත් ඒ ඔස්සේ අප කරන්නේ පාඨකයනට අපේ අදහස් ගෙනහැර දැක්වීම ය. බයිලා කතුවරයා සිටින්නේ ඒ එකක්වත් තේරුම්ගත හැකි හෝ තේරුම් ගැනීමට අවශ්‍ය හෝ මානසික තත්වයක නොවන බව ඔහු ලියන ලිපිවලින් පැහැදිලි ය. 1848න් පසු මෙරට ඉංගිරිසින්ට එරෙහිව කරන ලද සටනක් නොවීය යනුවෙන් ඔහු කියා ඇති දේ පිළිබඳ ව ජාතික ව්‍යාපාරය ජ වි පෙ හා අයවැය මැයෙන් ලියැවුණු ලිපියේ ද කෙටි සටහනක් වෙයි. එහි සඳහන් පරිදි 1848 මාතලේ හා සත්කෝරළය මුල් කරගෙන ඇරඹි නිදහස් සටන ජාතික ව්‍යාපාරයේ නායකත්වයෙන් පැන නැගුණු එකකි. 1817-18 නිදහස් සටන ඉතා අමානුෂික ලෙස මර්දනය කෙරුණේ අද මානව හිතවාදීන් ලෙස වෙස් වළාගෙන සිටින බ්‍රිතාන්‍යයන් විසිනි. ඔවුහු සිංහල ජනගහණයෙන් සියයට දහයක් පමණ එදා ඝාතනය කළහ. සිංහල (දේශපාලන) නායකයන් සියළු දෙනාම පාහේ ඝාතනය කළ ඔවුහු ඉතිරි කිහිප දෙනා තම පැත්ත ගැනීම නිසා ආරක්ෂා කර ඔවුන්ට ඉඩකඩම් තනතුරු ආදිය ලබාදුන්හ. එයට අමතරව තවත් අයට තම පැත්ත ගැනීම නිසා එලෙස සළකා ඔවුන් ද සිංහලයන්ගේ නායකයන් බවට පත්කළහ. කෙටියෙන් කියන්නේ නම් 1817න් පසුව සිංහලයන්ට නායකයන් සැපයීමට ඉංගිරිසිහු වගබලාගත්හ.

අවුරුදු දෙදහසකට වැඩි මෙරට ජාතික ව්‍යාපාරය විසින් ඒ බව එකලම අවබෝධ කරගන්නා ලද බවට සැකයක් තිබිය නො හැකි ය. බයිලා කතුවරයා සිංහලයන් බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයට එරෙහිව 1848න් පසුව සටනක් කර නැතැයි කියයි. එහෙත් එහි දී ද ඔහු වැරදි ය. සංකල්පීය ව නිරවුල්ව සිතීමට තරම් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් හෝ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් හෝ ඔහුට ආභාසයක් ලැබී නැත. සංකල්පීය නිරවුල් බව ඔහුට ආගන්තුක වූවකි. ඔහු ඉතා මතුපිටින් බොහෝ දේ තේරුම් ගැනීමට උත්සාහ කරන්නේ අවුල් ජාලයක ය. ඔහු ජෙනිංග්ස්ගේ නමින් පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ශාලාවක් විවෘත කිරීමට විරුද්ධ වූ ජ වි පෙ තරුණයන්ගේ හා අපේ අදහස් අතර සමානත්වයක් දකින්නේ ද ඒ අවුල් ජාලයේ පැටලී ය. මම මොහු සමග ප්‍රසිද්ධ විවාදයක් කිරීමට කැමැත්තෙන් පසුවෙමි. එවිට කාලෝ ෆොන්සේකා හා වික්‍රමබාහු කරුණාරත්න යන ව්‍යාජ බුද්ධිමතුන්ට මෙන් ම මොහුට ද තම තරම දැනගැනීමට හැකි වනු ඇත.

සිංහලයන්ට නායකත්වය විසින් ම සැපයුණු තමන්ගේ ම වූ සෘජු දේශපාලන නායකයන් අහිමි වූයේ 1848න් පසුව නොව ඉහත ද සඳහන් පරිදි 1817න් පසුව ය. එහෙත් එපමණකින් මෙරට ජාතික ව්‍යාපාරය නිහඬ නො වී ය. එකල ජාතික ව්‍යාපාරයේ පෙරමුණේ සිටි භික්ෂූන් වහන්සේ හා අනෙක් අය 1848 සටන සඳහා ගොංගාලේගොඩ බණ්ඩාගේ හා පුරං අප්පුගේ දේශපාලන නායකත්වය ලබාගත්හ. වෙනත් වචනවලින් කියන්නේ නම් ජාතික ව්‍යාපාරය විසින් ඒ දෙදෙනා සිංහලයන්ගේ සෘජු දේශපාලන නායකයන් ලෙස පත්කර ගනු ලැබිණි. එහෙත් ඉන්පසු 1956 වනතුරු ම

© Prof. Nalin De Silva

සිංහලයන්ට තමන්ගේ ම වූ සෘජු දේශපාලන නායකත්වයක් පත්කර ගැනීමට නො හැකි විය. එයට හේතුව බයිලා කතුවරයා නොයෙක් වර කියන කුල ප්‍රශ්නය නොව බ්‍රිතානීන් එයට වූ ඉඩකඩ කල්තබා අසුරා දැමීම ය. කුල ප්‍රශ්නය හේතුවක් වී නම් කරාවේ කුලයේ යැයි සැලකෙන පුරං අප්පු එදා මාතලේ හා සත්කෝරළේ ජනතාව ප්‍රමුඛ සිංහලයන්ගේ නායකත්වයට පත්කරගැනීමක් නොවනු ඇත. සිංහලයන් අතර කුල ප්‍රශ්නයක් යම් පමණකට පසුව ඇති වී නම් එය ද බ්‍රිතානීන්ගේ සටකපටකම් වල ප්‍රතිඵලයක් පමණක් විය.

1848 නිදහස් සටන ද බ්‍රිතානි මානව හිතවාදීන් විසින් අමානුෂික ලෙස මර්දනය කරනු ලැබීමෙන් පසුව ජාතික ව්‍යාපාරයයේ සෘජු දේශපාලන නායකත්වයට පත්කරගනු ලැබුයේ බණ්ඩාරනායක මහතා ය. ඒ 1954 දී පමණ ය. එලෙස පත්කර ගැනීමේ දී මෙත්තානන්ද මහතා වැනි අය ප්‍රමුඛත්වයක් ගත්හ. මෙත්තානන්ද මහතා පමණක් නොව එයට පෙර සිටි අනගාරික ධර්මපාලතුමා ද සිංහල ජාතික ව්‍යාපාරයේ නායකයන් මිස සිංහලයන්ගේ සෘජු දේශපාලන නායකයෝ නො වූහ. ධර්මපාලතුමාගේ යටත්විජිත විරෝධී අරගලය මූලික වශයෙන් ම සංස්කෘතික අරගලයක් විය. 1848 න් පසු සෘජු දේශපාලන නායකත්වයක් රහිත වූ ජාතික ව්‍යාපාරය යටත්විජිත විරෝධී අරගලයේ සංස්කෘතික සංරචකය ගැන අවධාරණය කිරීම පුදුමයක් නො වේ. 1956 දේශපාලනයේ පවා සංස්කෘතික සංරචකය ඉස්මතු වූයේ එවැනි ඓතිහාසික සන්දර්භයක ය. යටත්විජිතවාදයට එරෙහිව සෘජු දේශපාලන අරහලයක් නොතිබූ පමණින් ම සිංහලයන් යටත්විජිතවාදයට එරෙහි ව සටන් නො කෙළේ යැයි කියන්නේ එක්කෝ නොදැනුවත්කමට ය. නැත්නම් සිංහල බෞද්ධයන්ට එරෙහිව තම සිතෙහි ඇති වෛරය හේතුකොටගෙන ය. බයිලා කතුවරයා තම පුවත්පතින් මේ වෛරය වපුරවන ආකාරය සතිපතා දැකගත හැකි ය.

අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධ වන්නේ පරසුද්දන්ට විරුද්ධවන ආකල්පයකින් නො වෙයි. බයිලා කතුවරයාට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ වි පෙ සිසුන් පිරිසක් ජෙනිංග්ස් මහතාගේ නමින් ශාලාවක් හැඳින්වීමට විරුද්ධ වී ඇත්තේ ඔහු පරසුද්දකු ලෙස සලකමින් විය යුතු ය. බයිලා කතුවරයා අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධවන්නේ ද එවැනි ආකල්පයකින් යැයි උපකල්පනය කරයි. අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධවන්නේ අපේ ස්වාධීනත්වය එදත් අදත් නැතිකරන්නේ ඒ නූතනත්වයේ අංගයක් වූ යටත්විජිතවාදය වීම පෙරදැරි කරගෙන ය. අනෙක් අතට එමගින් ලෝකයට ම සිදුවන හානිය නිසා ය.

ජෙනිංග්ස් මහතා සම්බන්ධ අපේ ස්ථාවරයෙන් ඒ බව තවත් පැහැදිළි වනු ඇත. මේ පිළිබඳ කරුණු විදූසර පුවත්පතට ලියා ඇති මුත් ඉරිදා දිවයින පාඨකයන්ගේ දැනගැනීම සඳහා කරුණු කිහිපයක්වත් සඳහන් කළ යුතු යැයි සිතමි. හෙනිංග්ස් මහතාගේ නම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාලාවකට යෙදීම ගැන අපේ කිසිම විරුද්ධතාවක් නැත. අපේ අදහස අනුව ඒ කළයුතුව තිබුණේ බොහෝ කලකට පෙර ය. අප එසේ කියන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය වැනි විජාතික ආකල්ප මත ක්‍රියාත්මක වන ආයතනයකට ජෙනිංග්ස් මහතාගේ නමින් ශාලාවක් තිබීමේ කිසිම විසංවාදයක් නොමැති බැවිනි. විශ්වවිද්‍යාල යනු මූලික වශයෙන් ම විජාතික අධ්‍යාපනයක් ලබාදෙන ආයතන වෙයි. අවුරුදු පහළොවකට පමණ පෙර ජී එල් පීරිස් මහතා මා කොළඹ විශ්වවිද්‍යාලයෙහි ජාතික චින්තනය උගන්වන්නේ දැයි ඇසූවිට මා ඔහුට කීවේ අනෙක් අයට වජාතික චින්තනය ඉගැන්වීමට හැකිනම් මට ජාතික චින්තතනය ඉගැන්වීමට හැකි බව ය. එවිට ඔහු මගෙන් ඇසුවේ තව කලක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට අදහස් කරන්නේ ද යන්න ය. මා ඔව් යැයි පවසා පැමිණයත් ඉන් මාස කිහිපයකට පසුව මා විශ්වවිද්‍යාලයෙන් නෙරපා දැමිණි. මෙරට විශ්වවිද්‍යාල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රධාන ආයතන බවට පත්කිරීමේ දී ජෙනිංග්ස් මහතාගෙන් සිදුවූයේ අති විශාල කාර්යභාරයකි. එබැවින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය වැනි ආයතනයක ජෙනිංග්ස් මහතාගේ නමින් ශාලාවක් තිබීමේ කිසිම වරදක් නැත. අපට ප්‍රශ්නය වන්නේ පේරාදෙණියේ ජෙනිංග්ස් ශාලාවක් තිබීම නොව සංඝමිත්තා ශාලාවක් තිබීම ය. මේ සංඝමිත්තා යනු සංඝමිත්තා මෙහෙණින් වහන්සේ නම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එනමින් ශාලාවක් තිබීමේ කිසිදු අදාළත්වයක් නැත. ඒ සංඝමිත්තා මෙහෙණින් වහන්සේට කරන අගෞරවයකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කණුවල ඇති ඇම්බැක්කේ කැටයම් හා එහි ඉගැන්වෙන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රවාද හා සංකල්ප අතර කිසිදු සම්බන්ධයක් නැත. ඒ කැටයම් හුදෙක් බාහිර රැවටීමක් පමණකි. ඒ විශ්වවිද්‍යාලයට කෙසේ වෙතත් ජනතාවට කණු තිබීමක් පමණකි. සංඝමිත්තා ශාලාවද එබඳු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva